**විසර්ජන ශීර්ෂය - 264**

**යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

-------------------------------------

**විගණකාධිපති වාර්තාව -2012 වර්ෂය**

-----------------------------------------

1.1. **දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්**

-------------------------------------------------

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කටයුතු සම්බන්ධීකරණය හා පාලනය කිරීම.

(ii) දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් කාර්ය සාධනය වැඩි දියුණු කිරීම.

(iii) නීති මගින් පැවරුණු කටයුතු නිලධාරීන් හා සංවිධාන මගින් ගම් මට්ටමින් හා ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම.

(iv) ආදායම රැස් කිරීමේදී වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල නියෝජිතයා ලෙස කටයුතු කිරීම.

(v) විමධ්‍යගත අයවැය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(vi) පළාත් සභාවේ කටයුතු සඳහා සහාය වීම.

(vii) ප්‍රාදේශීය මට්ටමින් පාලනය පිළිබඳ තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා පළාත් සභාවේ සහ පළාත් පාලන ආයතනවල මානව සම්පත්, සංවර්ධනය හා වැඩි දියුණු කිරීම.

(viii) ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ පළාත් සභාවට හා පළාත් පාලන ආයතනවලට අදාළ කටයුතු සිදු කිරීම.

(ix) විදේශ අරමුදල් මූලායයන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පළාත් සභාව විසින් අවශ්‍ය මඟ පෙන්වීම් හා අධීක්ෂණය සැපයීම මගින් තහවුරු කිරීම.

(x) පළාත් සභාවට හා පළාත් පාලන ආයතනවලට සහාය වීම.

1.2 **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

-------------------------------------------------------------------

(i) ප්‍රාදේශීය ලේකම් කාර්යාල

-----------------------------

(අ) යාපනය

(ආ) වේලනෙයි

(ඇ) වලිකාමම් නැගෙනහිර

(ඈ) වලිකාමම් උතුර

(ඉ) වලිකාමම් බටහිර

(ඊ) වලිකාමම් දකුණ

(උ) වඩමරච්චි නිරිත

(ඌ) වඩමරච්චි උතුර

(එ) තෙන්මරච්චි

(ඒ) නල්ලූර්

(ඔ) වලිකාමම් නිරිත

(ඕ) වඩමරච්චි නැගෙනහිර

(ක) ඩෙල්ෆ්ට්

(ග) කරෙයිනගර්

(ජ) කයිට්ස්

## 1.3 විගණන විෂය පථය

යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා , සැසඳුම් ප්‍රකාශන , පොත්පත් , ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 අගෝස්තු 15 දින දිස්ත්‍රික් ලේකම් වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ , අදහස් දැක්වීම් සහ සොයා ගැනීම් , විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්තක සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන් , රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම , පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.5 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිලිබඳ විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය වාර්තා හා පොත් අනුව යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් පකාශන මෙම වාර්තාවේ (අ) සිට (ඊ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 1.6 සිට 1.13 දක්වා වූ ඡේදවල ඇතුළත් ප්‍රධාන විගණන නිරීක්ෂණ හැර සතුටුදායක ලෙස පිලියෙල කර ඇති බව නිරීක්ෂණය වේ.

### (අ) ලේඛන පොත් හා වාර්තා නොපැවැත්වීම

දිස්ත්‍රක් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ලේඛන පවත්වා නොතිබුණු අතර, වෙනත් සමහර ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව විගණන නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි |
| බැරකම් ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි |
| පාඩු හා හානි ලේඛනය | මුදල් රෙගුලාසි 110, 104 (3) සහ (4) | විධිමත්ව පවත්වා නොතිබුණි |
| විසර්ජන (වැය) ලේජරය | මුදල් රෙගුලාසි 447 | විධිමත්ව පවත්වා නොතිබුණි |

### (ආ) විසර්ජන ගිණුම

#### (i) මුළු ප්‍රතිපාදනය හා වියදම

යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඒ යටතේ ක්‍රියාත්මක වන ප්‍රාදේශිය ලේකම් කාර්යාල සඳහා සලසා තිබුණු මුළු ප්‍රතිපාදනය රු.530,504,383 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.525,187,938 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ශුද්ධ

ඉතිරි කිරීම් රු.1,234,231 සිට රු.4,082,214 ක් හෙවත් සියයට 0.25 සිට සියයට 9.41 පරාසයක ප්‍රමාණයක විය. විස්තර පහත දැක්වේ.

| වියදම් | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට උපයෝජනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය මුළු ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 365,660,000 | 487,141,735 | 485,907,504 | 1,234,231 | 0.25 |
| මූලධන | 43,200,000 | 43,362,648 | 39,280,434 | 4,082,214 | 9.41 |
| මුළු වියදම | 408,860,000 | 530,504,383 | 525,187,938 | 5,316,445 | 1.00 |

(ii) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 19 කින් හා දෙපාර්තමේන්තු 10 කින් පිළිවෙලින් රු.මිලියන 371.6 කින් හා රු.මිලියන 3,346 කින් සමන්විත එකතුව රු.මිලියන 3,717.6 ක් වූ ප්‍රතිපාදන ලබා දී තිබුණ. එයින් පිළිවෙලින් රු.මිලියන 332 කින් හා රු.මිලියන 3,339.7 කින් සමන්විත රු.මිලියන 3,671.7 ක මුදලක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 46 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

(iii) **රාජ්‍ය වියදම් කළමනාකරණය**

2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2012 වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ ප්‍රතිපාදනය කරන ලද පුනරාවර්තන වියදම් වලින් සියයට 2 ක ප්‍රතිපාදන ඉතිරිකළ යුතු වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සියයට 0.25 ක් පමණක් ඉතිරි කර තිබුණි.

(ඇ) **ආදායම් ගිණුම**

**ඇස්තමේන්තු කළ හා තථ්‍ය ආදායම**

දිසත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ආදායම් සංකේත 06 ක් සඳහා ඇස්තමේන්තු කරන ලද ආදායම රු.මිලියන 27.45 ක් වු අතර ආදායම් සංකේත 11 ක් සඳහා 2012 වර්ෂය තුළදී ඇස්තමේන්තු සකස් කර නොතිබුණි. රු.මිලියන 135.13 ක් වු ආදායමක් රැස්කර ගෙන තිබුණි. ඇස්තමේන්තු කරන ලද ආදායමෙන, සියයට 93.29 සිට සියයට 252.50 දක්වා පරාසයක වු ආදායමක් රැස්කර ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය අදායම | අඩුවෙන් / අතිරික්තය | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| 2006.02.00 | 600,000 | 1,515,000 | 915,000 | 252.50 |
| 2003.99.00 | 16,000,000 | 27,696,987 | 11,696,987 | 173.11 |
| 2003.02.99 | 7,000,000 | 6,530,396 | (469,604) | 93.29 |
| 2002.02.99 | 3,500,000 | 4,036,198 | 536,198 | 115.32 |
| 2002.01.01 | ඇස්තමේන්තු කර නැත | 4,900 | 4,900 | - |
| 1003.06.00 | ඇස්තමේන්තු කර නැත | - | - | - |
| 1003.07.05 | 4,200 | 5,770 | 1,570 | 137.38 |
| 1002.07.00 | ඇස්තමේන්තු කර නැත | - | - | - |
| 1003.07.02 | ඇස්තමේන්තු කර නැත | 90,900 | 90,900 | - |
| 1003.07.03 | ඇස්තමේන්තු කර නැත | 417,933 | 417,933 | - |
| 1003.07.04 | ඇස්තමේන්තු කර නැත | - | - | - |
| 1003.07.99 | 350,000 | 399,760 | 49,760 | 114.22 |
| 2002.01.02 | ඇස්තමේන්තු කර නැත | 103,225 | 103,225 | - |
| 2003.02.07 | ඇස්තමේන්තු කර නැත | 12,809,600 | 12,809,600 | - |
| 2003.02.13 | ඇස්තමේන්තු කර නැත | 5,822,125 | 5,822,125 | - |
| 2003.02.14 | ඇස්තමේන්තු කර නැත | 60,802,843 | 60,802,843 | - |
| 2004.01.00 | ඇස්තමේන්තු කර නැත | 14,897,085 | 14,897,085 | - |
| | 27,454,200 | 135,132,722 | | |

**(ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**පාර්ලිමේන්තුව විසින් බලය දෙන ලද සීමා**

විෂය අංක 26401 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විසින් බලය දෙන ලද සීමා සහ තථ්‍ය වටිනාකම් පහත දැක්වේ.

| වියදම | | ලැබීම | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 43,000,000 | 34,481,817 | 23,000,000 | 30,268,234 | 120,000,000 | 94,228,535 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මියගිය, විශ්‍රාම ගිය හා සේවය අතහැර ගිය නිලධාරීන් 7 ක ගෙන් ලැබිය යුතු රු.277,697 ක් වූ මුදලක් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) 1994 සිට 1996 වර්ෂය සඳහා දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්හි දැක්වෙන රු.86,246 ක වෙනස නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) 1988 අගෝස්තු 30 දිනැති අංක 29/88 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එකතුව රු.2,945,112 ක් වූ වර්ෂ එක / වර්ෂ දෙක ණය ලබාදී තිබුණි. මේ සම්බන්ධයෙන් වර්ෂ එක / වර්ෂ දෙක ණය ගෙවීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**(ඉ) අග්‍රිම ගිණුම**

(i) මුදල් රෙගුලාසි 371 විධිවිධානවලට පටහැනිව එකතුව රු.3,987,974 ක් වූ අතුරු අග්‍රිම අවස්ථා 52 කදී ලබාදී තිබූ අතර අදාළ කාර්යය නිම කර මාස 1 සිට මාස 11 කින් පසු එම අග්‍රිම නිරවුල් කර තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 371(2)(ආ) ප්‍රකාරව මාණ්ඩලික නිලධාරියකුට එක් වරකට රු.20,000 ක් නොඉක්මවන පරිදි අතුරු අග්‍රිම ලබාදිය හැක. කෙසේ වුවද රෙගුලාසිවලට පටහැනිව අවස්ථා 48 කදී නිලධාරීන් 92 කට එකතුව රු.5,083,236 ක් වූ උප අග්‍රිම රු.20,000 ක් ඉක්මවා ලබා දී තිබුණි.

(iii) සුළු මුදල් අග්‍රිමය රු.7,500 ට සීමා කර තිබුණද, භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව රු.10,000 ක සුළු මුදල් අග්‍රිම නිකුත් කර තිබුණි.

(ඊ) **පොදු තැන්පත් ගිණුම**

2012 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.66,075,068 ක් වු අතර විස්තර පහත දැක්වේ.

| ගිණුම් අංකය | 2012 ජනවාරි 01 දිනට ශේෂය | හර | බැර | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| 6003/0/0/40/0 | 112,741,312 | 408,216,701 | 361,550,457 | 66,075,068 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත්වල හා මහා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අතර අවසාන ශේෂයන් සම්බන්ධයෙන් රු.22,046,383 ක් වු වෙනස්කම් නිරීක්ෂණය විය.

(ii) තැන්පතු ගිණුමේ දැක්වෙන රු.3,030,586 ක් වු හදුනා නොගත් ශේෂය හදුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) 2012 දෙසැම්බර් 31 දිනට තැන්පතු ගිණුමේ ශේෂ පිළිබද කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iv) එකතුව රු.1,305,584 ක් වු කල් ඉකුත් වු තැන්පතු 06 ක් පිළිබදව මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(v) එකතුව රු.7,577,117 ක් වු ව්‍යාපෘති අරමුදල් නවයක් අරමුණු කළ කාර්යයන් සඳහා උපයෝජනය කිරීමෙන් තොරව තැන්පතු ගිණුමේ තබා තිබුණි.

(vi) මාර්ග බලපත්‍ර වලින් රැස් කරන ලද රු.21,793,511 ක් වු මුදල් 2003 මැයි 07 දිනැති අංක එන්ටීසී/පීඕඑල්/98 /22 දරන ජාතික ප්‍රවාහන කොමිෂන් සභාවේ ලිපිය පකාරව ආදායම් ගිණුමට ප්‍රේෂණය කිරීමෙන් තොරව රු.4,237,327 ක වියදම් දැරීමෙන් පසුව තැන්පතු ගිණුමේ තබා තිබුණි.

(vii) රු.12,013,518 ක් වු වැලි බලපත්‍ර වලින් ආදායම් රැස්කිරීම් 2009 වර්ෂයේ සිට තැන්පතු ගිණුමේ තබා තිබුණි. මෙම තැන්පතු වලින්, රු.2,047,410 ක මුදලක් මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළ ඇස්තමේන්තු ප්‍රතිපාදන නොමැතිව විවිධ මූලධන වැඩ හා වැටුප් ගෙවීම සඳහා වැයකර තිබුණි.

(viii) දිරිදීමනා ගෙවීම සඳහා අනුමත යෝජනා ක්‍රමයක් නොමැතිව රු.මිලියන 3,425 ක් වු දිරිදීමනා එවකට දිස්ත්‍රික් ලේකම් ඇතුළු නිලධාරීන් 24 දෙනෙකුට ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන නොමැතිව තැන්පතු ගිණුමේ තබා තිබුණු විවිධ ආදායම් රැස්කිරීම් වලින් පුද්ගලික නැව් මගී ප්‍රවාහන සේවාවේ කාර්යයන් සඳහා ගෙවීම් ලෙස මෙම ගෙවීම් සිදුකර තිබුණි. කෙසේ වුවද, මෙම මගී නැව් සේවාව 2009 මාර්තු මාසයේදී නතර කර තිබුණි. 2012 වර්ෂය තුළදී පුද්ගලික මගී නැව් සේවාව සම්බන්ධයෙන් විශේෂ කාර්යයන් කිසිදු නිලධාරියකු විසින් සිදුකර නොතිබුණද, වැටුප් හා අතිකාල දීමනා හා වෙනත් දීමනා ගෙවීම් වලට අමතර වශයෙන් දිනකට රු.500 බැගින් එම කාර්යයන් සම්බන්ධයෙන් ගෙවා තිබුණි.

## 1.6 ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය

---

### 1.6.1 සංයුක්ත සැලැස්ම

---

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට අවම වශයෙන් ඉදිරි වර්ෂ 3 ක් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වර්ෂය ආරම්භයේදී සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, 2012 දෙසැම්බර් 31 දක්වා එම සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 1.6.2 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

---

ඉහත 1.6.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය සහ 2002 සැප්තැම්බර් 12 සහ 2004 පෙබරවාරි 20 දිනැති පිළිවෙලින් අංක 402 හා 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව මුදල් වර්ෂය අවසන්වී දින 150 ක් ඇතුළත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 සැප්තැම්බර් 30 දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 1.6.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

(i) 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2012 වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම වර්ෂය ආරම්භයේදී පිළියෙල කර නොතිබුණි.

(ii) ලංසු ලියකියවිලි හා ලංසුකරුවන්ගේ පූර්ව සුදුසුකම් ලියකියවිලි තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් අනුමත කර නොතිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ 2.11.3 මාර්ගෝපදේශයෙහි දක්වා ඇති නිශ්චිත ආකෘතියෙහි ලංසු විවෘත කිරීමේ කමිටුව, ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණ ඇගයම් කමිටුව යන රැස්වීම්වල කටයුතු සටහන් කර නොතිබුණි.

(iv) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.3.20(9) ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් විසින් ලංසු ලියකියවිලි පිළියෙල කර නොතිබුණි.

(v) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.4.10 ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් විසින් සැපයුම්කරුවන්ගෙන් කාර්ය සාධන ඇපකර ලබාගෙන නොතිබුණි.

### 1.6.4 අභ්‍යන්තර විගණනය

සියළු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්යයන් ආවරණය කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීය. අභ්‍යන්තර විගණන වැඩ සටහන් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 1.6.5 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

2000 ජූනි 12 දිනැති අංක අයිඒඅයි/2000/01 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 4 ක් පවත්වනු වෙනුවට සමාලෝචිත වර්ෂය තුළදී යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කමිටු රැස්වීම් 2 ක් පමණක් පවත්වා තිබුණි.

### 1.7 වත්කම් කළමනාකරණය

#### (අ) නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

යාපනය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ යතුරු පැදි 04 ක් හා වෙනත් වත්කම් විෂයයන් 99 ක් වර්ෂ 01 සිට වර්ෂ 08 ක කාලයක් නිෂ්කාර්යව හෝ ඌන උපයෝජිතව පැවති බව විගණන නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

(ආ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

මුදල් රෙගුලාසි 756 හා 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්විය යුතු වුවද, 2012 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තා මාස 04 ක් ගතවීමෙන් පසුවත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) **බේරුම් නොකළ බැරකම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2012 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01 ට අඩු කාලයක් වූ බේරුම් නොකළ බැරකම් රු.1,215,477 ක් විය.

## 1.8 අනුකූල නොවීම්

(අ) **නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (i) <u>මුදල් රෙගුලාසි</u> | |
| 134 | විගණකාධිපතිවරයාගේ එකඟත්වය සහිතව අභ්‍යන්තර විගණන වැඩ සටහනක් පිළියෙල කර නොතිබුණි. |
| 237 (අ) | සතුටුදායක ලෙස වැඩ නිම කළ බවට විශේෂ සහතිකයක් ලබාගැනීමෙන් තොරව ඉදිකිරීම් වැඩවල කොටස් ගෙවීමක් ලෙස රු.13,676,130 ක මුදලක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබුණි. |
| 756 සහ 1647 (ආ) | මෝටර් වාහන සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදුකළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එවැනි සමීක්ෂණ සිදුකර නොතිබුණි. |

| | |
|---|---|
| 1645 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසන් ලොග් පොත් විධිමත්ව පවත්වා නොතිබුණි. |
| 1647 | මෝටර් වාහන සම්බන්ධයෙන් සියළු විස්තර ඇතුළත් ලේඛනයක් පැවැත්විය යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මෝටර් වාහන සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා නොතිබුණු අතර, මෝටර් වාහන පිළිබඳ විස්තර ලිපිගොනුවල ඇතුළත් කර නොතිබුණි. |

(ii) <u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ</u>

| | |
|---|---|
| 1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන චක්‍රලේඛය | රජයේ මෝටර් වාහන වල රජයේ මුද්‍රාව පින්තාරු කළ යුතු වුවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මෝටර් වාහන සම්බන්ධයෙන් එම අවශ්‍යතාවයට අනුව කටයුතු කර්මට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. |

## 1.9 කාර්ය සාධනය

පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනයට අදාළ නිරීක්ෂණය පහත දැක්වේ.

සමාලෝචිත වර්ෂය තුළදී ඉල්ලුම්පත් 29,521 ක් ලැබී තිබුණද, ඉල්ලුම්පත් 979 ක් ආපසු යවා තිබුණි. සම්පුර්ණ කරන ලද ඉල්ලුම්පත් 28,542 කින් ඉල්ලුම්කරුවන්ට නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත් පිළිබඳ විස්තර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි නොතිබුණි.

## 1.10 අවිධිමත් ගනුදෙනු

### අධිකාර් බලය නොලත් ගනුදෙනු

2012 ජනවාර් දිනැති අංක 2012/01 දරන ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛයට පටහැනිව පෙර පාසැල් ළමුන්ට නැවුම් කිරි වෙනුවට මිලි ලීටර් 150 ක කිරි කෝප්පයක් සැපයීම සඳහා පිටි කිරි මිලදී ගැනීම වෙනුවෙන් රු.316,560 ක මුදලක් ඩෙල්෴ට් , ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වැය කර තිබුණි.

## 1.11 පාඩු හා හානි

පාඩු පිළිබඳ විස්තර නොමැතිව රු.4,522,321 ක් වු පාඩු විසර්ජන ගිණුමේ හෙළිදරව් කර තිබුණි.

## 1.12 වෙන්දේසි විකුණුම්

අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය සහිතව ගර්හිත මෝටර් වාහනයක් වෙන්දේසි කර තිබුණු අතර, එම මෝටර් රථය රු.600,000 ක් වු ඇස්තමේන්තු මිලට වඩා වැඩි රු.1,515,000 ක් වු මිලකට වෙන්දේසි කර තිබුණි. මේ සම්බන්ධයෙන් 2004 අගෝස්තු 31 දිනැති අංක 353/5 දරන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව මෝටර් වාහනය තක්සේරු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 1.13 මෝටර් වාහන උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මෝටර් වාහන සඳහා දෛනික ධාවන සටහන් විධිමත්ව පවත්වා නොතිබුණි.

(ii). කිලෝමීටර් 2,657 ක ධාවනය කිරීම සඳහා නිල මෝටර් වාහන 15 ක් භාවිතා කළ නිලධාරීන් අදාළ දෛනික ධාවන සටහන් අත්සන් කර නොතිබුණි.

## 1.14 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා පුරප්පාඩු

2012 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| (i). | ජ්‍යෙෂ්ඨ මට්ටම | 63 | 45 | 18 |
| (ii). | තෘතියික මට්ටම | 59 | 19 | 40 |
| (iii). | ද්විතියික මට්ටම | 1,115 | 740 | 375 |
| (iv). | ප්‍රාථමික මට්ටම | 279 | 193 | 86 |
| | එකතුව | 1,516 | 997 | 519 |